# දඹුල්ල ප්‍රදේශයේ ශේෂව පවතින කාර්මික පුරාවිද්‍යාත්මක නිර්මාණ පිළිබඳ අධ්‍යයනයක්

එන්.ඩබ්ලිව්.එම්.එන්.මධුෂානි

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
nmadushani398@gmail.com

ප්‍රමුඛ පදඃ කාර්මික පුරාවිද්‍යාව, දඹුල්ල, කාර්මික උරුමය, තැපැල් පෙට්ටි, මාර්ග සංඥා

## හැදින්වීම

ශ්‍රී ලංකාව ඓතිහාසික විශිෂ්ට කලාත්මක හා සංස්කෘතික නිර්මාණයන්ගෙන් අනූන වේ. 18 වැනි සියවසේ දී ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයන්ගේ පාලන යටත්විජිතයක් බවට පත් වීමෙන් අනතුරුව මෙරට ආර්ථිකමය හා සංස්කෘතිමය වශයෙන් වෙනස්කම් රැසකට මුහුණ දී ඇත. ඒ අනුව විශේෂයෙන් වැවිලි කර්මාන්තය මත පදනම් වූ ආර්ථික ක්‍රමවේදයක් ස්ථාපනය වූ අතර ඊට අවශ්‍ය ප්‍රවාහන, සන්නිවේදන හා වෙනත් පොදු පහසුකම් ස්ථාපිත විය. එම යටිතල පහසුකම් සමකාලීන බ්‍රිතාන්‍ය ඉංජිනේරුමය තාක්ෂණික ක්‍රමවේදයන් මත පදනම් වූ අතර බ්‍රිතාන්‍යයේ නිපදවා මෙරටට ගෙන්වා ස්ථාපිත කරන ලද නිර්මාණයන් සේම මෙරට තුළම නිර්මාණය කරන ලද උපකරණ ද පවතී. බ්‍රිතාන්‍ය යුගයේදී මෙරට තුළ ස්ථාපිත කරන ලද කෘතීන් අතර අභාවයට පත් වූ හා අභාවයට පත් වෙමින් පවතින ඒවාද වර්තමානයේදී පවා නිරුපද්‍රිත ව භාවිතයට ගතහැකි මට්ටමේ ඒවා ද තිබීම හේතුවෙන් ලාංකේය කාර්මික පුරාවිද්‍යාව න්‍යායාත්මක විෂයයකට පමණක් ලඝු වීම වළක්වා තිබේ.

## පර්යේෂණ ගැටලුව හා අරමුණු

මෙමම අධ්‍යයනයේ දී පර්යේෂණ ගැටලුව ලෙස තෝරාගනු ලැබුවේ නූතන සංවර්ධන කටයුතු හේතුවෙන් විනාශ මුඛයට පත්වෙමින් පවතින දඹුල්ල නගරයේ කාර්මික පුරාවිද්‍යාත්මක නිර්මාණ පිළිබඳව හා ඒවායේ තාක්ෂණය කෙබඳු වී දැයි අධ්‍යයනය කිරීමයි. මෙහි දී දඹුල්ල නගරයේ අවට දක්නට ලැබෙන විවිධ ක්ෂේත්‍රයන් හා කාල පරිච්ඡේදයන් නියෝජනය කරන්නා වූ කෘතීන් පිළිබඳව දැනට ශේෂව ඇති දත්ත හා මූලාශ්‍රයගත තොරතුරු උපයෝගී කර ගනිමින් අධ්‍යයනය කිරීම පර්යේෂණයෙහි අරමුණ වේ.

## අධ්‍යයන ප්‍රදේශය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ස්ථාන හතරක මෙම නිර්මාණ පිහිටා තිබේ. දඹුල්ල- කොළඹ ප්‍රධාන මාර්ගයේ උසාවි හන්දියේ වළගම්බා පිරිවෙන් මාවතට වම් පසින් දෙවැනි ලෝක යුධ සමයට අයත් බංකර දෙක, දඹුල්ල-මහනුවර ප්‍රධාන මාර්ගයේ කණ්ඩලම් හන්දියේ සහ එම මාර්ගයේම ගිමන්හල ඉදිරිපිට පැරණි බස් නැවතුම් සංඥා පුවරු,තැපැල් කාර්යාලය ඉදිරිපිට ඇති තැපැල් පෙට්ටිය මෙම අධ්‍යයනය සඳහා පාදක කර ගැණුනි.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙමම කාර්මික පුරාවිද්‍යා අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණය හා

අධ්‍යයනයත් ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය ලෙස පුස්තකාල ගවේෂණය මෙන්ම පූර්ව පර්යේෂකයන්ගේ අදහස් ද අධ්‍යයන ක්‍රමවේදයන් ලෙස භාවිතයට ගන්නා ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

### තැපැල් පෙට්ටිය

කාර්මික පුරාවිද්‍යාත්මක නිර්මාණ ලෙස සැලවීම යනු හුදු අභාවයට ගිය හෝ භාවිතයෙන් තොර වූ නිර්මාණයන් ලෙස සැලකීම සුලබ වුවද එය සාවද්‍ය වන අවස්ථා ද දුර්ලභ නොවේ. ඒ අනුව තැපැල් කාර්යාලය ඉදිරිපිට ඇති තැපැල් පෙට්ටිය තවමත් භාවිතයට ගනිමින් පවතී. එය ක්‍රි.ව 1950-1972 අතර කාලයට අයත් වේ. සම්පූර්ණ උස මීටර් 1.4කින් යුක්ත වන මෙම තැපැල් පෙට්ටියෙහි වට ප්‍රමාණය මීටර් 1.5ක් වේ. පැහැදිලි ව හඳුනාගත හැකි පැරණි රාජ්‍ය ලාංඡනයක් මෙහි අන්තර්ගතව ඇති අතර එය වෘත්තාකාර හැඩයක් ගනී. එහි විෂ්කම්භය මීටර් 0.3ක් වේ.

### බංකර

ශ්‍රී ලංකාව කාර්මික රටක් නොවූවද ඉතා විශිෂ්ට ඉංජිනේරුමය ගුණාංගවලින් හෙබි නිර්මාණ මෙරට තුළ වේ. ඒ අනුව දෙවැනි ලෝක යුධ සමයට අයත් විශාල ප්‍රමාණයේ බංකර දෙකක් දඹුල්ල ප්‍රදේශයේ පැවතීම විශ්මයට කරුණකි. ඉතාමත් ඝණකම් අඟල් 1 1/2ක් පමණ වන කම්බි සහ සවිමත් කොන්ක්‍රීට් යොදාගෙන නිර්මාණය කර ඇති මෙම බංකර වර්තමාන පොළව මට්ටමේ සිට අඩි දෙකක් පමණ පහළට වන්නට තිබේ. එම බංකර දෙකම එකිනෙකට මුහුණලා මීටර් 100ක පමණ දුරකින් පිහිටා ඇති නමුත් එකම හැඩයෙන් හා ප්‍රමාණයෙන් සමන්විතය. එනම්, දිග, පළල හා උස පිළිවෙලින් මීටර් 5.5, මීටර් 3 හා මීටර් 1.7 වේ.

### මාර්ග සංඥා

දඹුල්ල නගරයේ ඇති කාර්මික උරුමය අතර කණ්ඩලම් හන්දියේ ඇති පැරණි බස් නැවතුම් සංඥා පුවරුව ඉතා සුවිශේෂී නිර්මාණයකි. එය මුළුමණින්ම යකඩින් නිම වූ එකක් වීමත් බස් රථයක්, නිර්මාතෘ හා ස්ථාන නාමය පැහැදිළිව සලකුණු කර තිබීම ඊට හේතුවයි. මෙම පුවරුව පොළවට සම්බන්ධ කර ඇති ආධාරකය ද යකඩවලින් නිර්මාණය කර තිබේ. එය උස අඩි 7ක් වන අතර පුවරුවෙහි දිග අඩි 01 අඟල් 06ක්, පළල අඩි 02කි. ගිමන්හල ඉදිරිපිට ඇති සංඥා පුවරුද මෙම ප්‍රමාණවලින් ම අනූන වන අතර සුදු හුණුවලින් වර්ණ ගන්වා තිබීම හේතුවෙන් සලකුණු ඉතා පැහැදිළි ව හඳුනාගත හැකිය.

සමකාලීන බ්‍රිතාන්‍ය ඉංජිනේරුමය තාක්ෂණික ලක්ෂණයන්ගෙන් සමන්විත වන්නා වූ දඹුල්ල ප්‍රදේශයට උරුමව ඇති කාර්මික පුරාවිද්‍යාත්මක කෘතීන් වියැකී යාමට ඉඩ නොහැර මතු අනාගත ශිෂ්‍ය පරම්පරාව උදෙසාත්, සංචාරක නැරඹුම් ස්ථාන ලෙසත් නඩත්තු කර පවත්වා ගැනීම තුළින් ලාංකේය තිරසාර සංවර්ධනය කෙරෙහි එය මහගු පිටුවහලක් වනු නොඅනුමානය.

## ආශ්‍රිත ග්‍රන්ථ


Kodithuwakku, Kusumsiri., Thenuwara, Thilini Ayesha. (2013) ***Early post boxes in Sri Lanka***. Rajarata University Of Sri Lanka.

කොඩිතුවක්කු, කුසුම්සිරි. (2013)***ශ්‍රී ලංකාවේ කාර්මික උරුමය සංචාරක ප්‍රවර්ධනය සඳහා වන විභවතාවක***.ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.